ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
பிரதான செயலாளர் அலுவலகம் - தென் மாகாணம்
CHIEF SECRETARY'S OFFICE - SOUTHERN PROVINCE

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය / எனது இல / My Ref. | CSS/7/1/3 | ඔබේ අංකය / உனது இல / Your Ref. | | දිනය / திகதி / Date | 2019.12 27 |

**ප්‍රධාන ලේකම් චක්‍රලේඛ (මුදල්) - 11/2019**

දකුණු පළාත් සභාවේ සියළුම
ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන් හා
ගණන්දීමේ නිලධාරීන් වෙත,

**<u>ඇස්තමේන්තු සකස් කිරීමේ සීමාවන්, අනුමත කිරීමේ සීමාවන් හා ගිවිසුම්වලට එළඹීමේ සීමාවන් සංශෝධනය කිරීම.</u>**

දකුණු පළාත් සභාවට අයත් ආයතන වල ඉදිකිරීම් කටයුතු කඩිනම් කිරීම සඳහා ඇස්තමේන්තු සකස් කිරීම, නිර්දේශ කිරීම හා අනුමත කිරීමේ බලතල විමධ්‍යගත කිරීම සඳහා 2019.06.24 දින පවත්වන ලද සාකච්ඡාව අනුව සකස් කළ කමිටු වාර්තාවේ සඳහන් කරුණුවලට ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ආණ්ඩුකාර ලේකම්ගේ අංක G/SP/1/2/1/3/19 හා 2019.07.25 දිනැති ලිපියෙන් ලබා දුන් අතර, ඒ අනුව ප්‍රධාන ලේකම් චක්‍රලේඛ (මුදල්) – 05/2019 නිකුත් කරන ලදී. නමුත් වඩාත් කාර්යක්ෂම සේවයක් සඳහා මූල්‍ය වටිනාකම රු.ලක්ෂ 20 ට අඩු ඇස්තමේන්තු සකස් කිරීමේ බලතල පැවරීම හා ඉංජිනේරුවන්ගේ ඇස්තමේන්තු අනුමත කිරීමේ හා ගිවිසුම් වලට එළඹීමේ බලතල නැවත සංශෝධනය සඳහා යෝජනා වී තිබුණි. ඒ අනුව 2019.10.30 දින ගරු ආණ්ඩුකාරතුමාගේ ප්‍රධානත්වයෙන් ආණ්ඩුකාර ලේකම් කාර්යාලයේදී පැවැත්වූ සාකච්ඡාවට අනුව ඇස්තමේන්තු සකස් කිරීම, නිර්දේශ කිරීම හා අනුමත කිරීමේ බලතල පහත ආකාරයට සංශෝධනය කිරීමට යෝජනා වී ඇත. එම යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය 2019.12.26 දින ලබාදී ඇති බව ආණ්ඩුකාර ලේකම්ගේ අංක G/SP/1/2/1/1/2019 හා 2019.12.27 දිනැති ලිපියෙන් දන්වා එවා ඇත. (එම ලිපියේ පිටපතක් මේ සමඟ අමුණා එවමි.)

1. **මූල්‍ය වටිනාකම රු.ලක්ෂ 20 ට අඩු ඇස්තමේන්තු අනුමත කිරීමේ බලතල පැවරීම.**

**<u>කොන්දේසි</u>**

1.1 ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ පුහුණු / III පන්තියේ තාක්ෂණ නිලධාරීන් සකස් කරන ඇස්තමේන්තු (දිස්ත්‍රික් කාර්යාල වල/ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල/පළාත් පාලන ආයතන වල සිටින එම ශ්‍රේණි වලට අයත් තාක්ෂණික නිලධාරීන් මෙයට අදාල වේ.) ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ II හෝ I පන්තියේ නිලධාරියෙකු විසින් නිර්දේශ කළයුතු අතර, ඒ සඳහා වන අනුමැතිය අමාත්‍යාංශ ලේකම්/ දෙපාර්තමේන්තු ප්‍රධානී/ මහ නගර සභාවල නගරාධිපති / නගර සභා සභාපති/ ප්‍රාදේශීය සභා සභාපති විසින් ලබා දිය යුතුය.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary 091 2232343 | කාර්යාලය / காரியாலயம் / Office 091 2234052, 091 2226118 | ෆැක්ස් / பெக்ஸ் / Fax 091 2246299 | විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் / E-mail chiefsec1@sltnet.lk | වෙබ් අඩවිය / இ தளம் / Web site www.cs.sp.gov.lk
ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretary's Office, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.
"විශිෂ්ටත්වයෙන් 1 ට එන යහපාලනයක්"

ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ II හා I පන්තියේ නිලධාරීන් නොමැති පළාත් පාලන ආයතනවල රු.ලක්ෂ 10ට වැඩි ලක්ෂ 20ට අඩු ඇස්තමේන්තු, දිස්ත්‍රික් පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයේ තාක්ෂණික නිලධාරීන් (II/I/විශේෂ) වෙත යොමුකර අවශ්‍ය නිර්දේශ ලබා ගත යුතු වේ.

1.2 රු.ලක්ෂ 20 ට අඩු ඇස්තමේන්තු සඳහා වුව ද ඒවායේ විශේෂිත උපදෙස් ලබාගත යුතු ඉංජිනේරුමය විෂයන්, ව්‍යුහාත්මක සැලසුම් (Structural Drawing) ඇතුලත්ව ඇති විට තාක්ෂණ නිලධාරීන් විසින් අදාල ඇස්තමේන්තු පිලියෙල කිරීමේදී ඊට අදාල ක්ෂේත්‍රයේ (ගොඩනැගිලි, වාරිමාර්ග, මහාමාර්ග සඳහා අදාල වේ.) ප්‍රවීණත්වය ඇති ඉංජිනේරුවරුන්ගේ උපදෙස් ලබාගෙන අදාළ කටයුතු ඉටු කළ යුතුවේ.

## 2. ඒකක මිල ගණන් යොදා ගැනීම, මිල විශ්ලේෂණ අනුමැතිය හා රැඳවුම් මුදල් නිදහස් කිරීම.

2.1 අදාළ වර්ෂයේ අනුමත මිල ගණන් අනුසාරයෙන් ඇස්තමේන්තු සකස් කළ යුතුය.

2.2 වාර්ෂික මිල ගණන් සකස් කිරීම සෑම වසරකට දෙවරක් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් ඉංජිනේරු සේවා කාර්යාලය, පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව, පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය නියෝජනය වන පළාත් මිල කමිටුව මගින් සිදුකරන අතර, එසේ අනුමත වූ මිල ගණන් සෑම ආයතනයක්ම තම ඉදිකිරීම් කටයුතු සඳහා යොදාගත යුතුය.

2.3. බාහිර වැඩ (Extra Work) සඳහා යොදා ගැනෙන මිල විශ්ලේෂණ, විශේෂිත මිල ගණන් ව්‍යාපෘතිය භාර ඉංජිනේරුවරයාට යොමු කර විධිමත් අනුමැතියක් ලබා ගත යුතුය. ඉංජිනේරුවරයෙකුගේ අනුමැතිය නොලත් ඇස්තමේන්තු (පළාත් පාලන ආයතන ප්‍රධානීන්ගේ අනුමැතිය ලත් ඇස්තමේන්තු) වලට අදාළ වැඩ සඳහා වූ මිල විශ්ලේෂණ පළාත් පාලන දිස්ත්‍රික් ඉංජිනේරුගේ අනුමැතිය ලබා ගත යුතුය.

### 2.4. රැඳවුම් මුදල් නිදහස් කිරීම

රු.ලක්ෂ 10 ත් 20 ත් අතර රැඳවුම් මුදල් නිදහස් කිරීම හා අවසන් ගෙවීම් වලදී සෑම විටම ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ II,I හා විශේෂ පන්තියේ නිලධාරියෙකුගේ නිර්දේශය මත විය යුතු වන අතර, විශේෂ ගැටළු සහිත අවස්ථාවකදී පමණක් ඉංජිනේරුවරයෙකුගේ උපදෙස් හා මඟ පෙන්වීම ලබාගත යුතුය.

## 3.

### 3.1. ඉංජිනේරුවන්ගේ අධීක්ෂණය යටතේ ඉටු කරනු ලබන කර්මාන්ත

ඉංජිනේරුවන් විසින් ඇස්තමේන්තු අනුමත කිරීමේ හා ගිවිසුම් වලට එළඹීමේ මූල්‍ය සීමාවන් 3.2 වගුවෙහි සඳහන් අයුරින් ක්‍රියාත්මක කිරීම සුදුසු වන අතර, එක් එක් ආයතන වල ඉංජිනේරුවන්ගේ අනුමත කිරීමේ මූල්‍ය සීමාවන් ඉක්මවා යන විට ඉහල වටිනාකමින් යුතු ඇස්තමේන්තු අනුමැතිය ලබා ගැනීම නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) වෙත යොමු කළ යුතුය.

## 3.2 ඉංජිනේරුවන්ගේ ඇස්තමේන්තු අනුමත කිරීමේ හා ගිවිසුම් වලට එළඹීමේ බලතල.

| අනු අංක | ඇස්තමේන්තු මුල්‍ය සීමාව (රු) | ඇස්තමේන්තු සකස් කිරීම | නිර්දේශ කිරීම | අනුමත කිරීම | ගිවිසුම්ගත වීම මූල්‍ය සීමාව අනුව | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා)/ පළාත් වාරිමාර්ග අයත් කර්මාන්ත | | පළාත් පාලන දෙපාර්තමේන්තුවට අයත් කර්මාන්ත |
| 1. | ලක්ෂ 500 ට වැඩි | II ශ්‍රේණිය/ I ශ්‍රේණිය/ විශේෂ පන්තියේ තාක්ෂණ නිලධාරීන් | විශේෂ පන්තියේ තාක්ෂණ නිලධාරීන්/ දි.ඉ/ ප්‍ර.ඉ/ ගො.අධ්‍යක්ෂ | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉ.සේ) | ප්‍රධාන ලේකම් | | පළාත් පාලන ආයතන සඳහා අදාල වන නගර සභා ආඥා පනත පළාත් පාලන ආඥා පනත, මහ නගර සභා ආඥා පනත සහ අනෙකුත් ප්‍රඥප්ති අණපනත් මඟින් එම ආයතන වලට පැවරී ඇති බලතල ප්‍රකාරව ගිවිසුම් වලට එළඹීමේ බලතල එම ආයතන සතු වන අතර එම බලතල අනුව කටයුතු කල හැක. |
| 2. | ලක්ෂ 300ට වැඩි - ලක්ෂ 500ට අඩු | II ශ්‍රේණිය/ I ශ්‍රේණිය/ විශේෂ පන්තියේ තාක්ෂණ නිලධාරීන් | විශේෂ පන්තියේ තාක්ෂණ නිලධාරීන්/ දි.ඉ/ ප්‍ර.ඉ/ ගො.අධ්‍යක්ෂ | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉ.සේ) | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉ.සේ) | අදාල අමාත්‍යාංශ ලේකම් / දෙපාර්තමේන්තු ප්‍රධානී | |
| 3. | ලක්ෂ 200ට වැඩි - ලක්ෂ 300ට අඩු | II ශ්‍රේණිය/ I ශ්‍රේණිය/ විශේෂ පන්තියේ තාක්ෂණ නිලධාරීන් | විශේෂ පන්තියේ තාක්ෂණ නිලධාරීන්/ දි.ඉ/ ප්‍ර.ඉ/ | ගොඩනැගිලි අධ්‍යක්ෂ / වාරිමාර්ග අධ්‍යක්ෂ | ගොඩනැගිලි අධ්‍යක්ෂ/ වාරිමාර්ග අධ්‍යක්ෂක | | |
| 4. | ලක්ෂ 100ට වැඩි - ලක්ෂ 200ට අඩු | II ශ්‍රේණිය/ I ශ්‍රේණිය/ තාක්ෂණ නිලධාරීන් | විශේෂ පන්තියේ තාක්ෂණ නිලධාරීන් / දි.ඉ. | ප්‍ර.ඉ. (වෙ.ගො) / (පා.ගො.) / (වාරිමාර්ග) / (පළාත් පාලන) | ප්‍ර.ඉ.(වෙ. ගො) / (පා.ගො.) / (වාරිමාර්ග) /(පළාත් පාලන) | | |
| 5. | ලක්ෂ 50ට වැඩි - ලක්ෂ 100ට අඩු | ශ්‍රී.ලං.තා.සේ. පුහුණු/ III/II/I | I ශ්‍රේණිය/ විශේෂ පන්තියේ තාක්ෂණ නිලධාරීන්/ ප්‍රදේශීය ඉංජිනේරු | දි.ඉ. (ගො) / (වාරිමාර්ග) / (පළාත් පාලන)/ සිවිල් ඉංජිනේරු (ද.ප සෞඛ්‍ය දෙපාර්තමේන්තුව) | දි.ඉ. (ගො)/ (වාරිමාර්ග) /(පළාත් පාලන) | | |
| 6. | ලක්ෂ 20ට වැඩි - ලක්ෂ 50ට අඩු | ශ්‍රී.ලං.තා.සේ. පුහුණු/ III/II/I | I ශ්‍රේණිය/ විශේෂ පන්තිය/ ශ්‍රී.ලං.තා.සේ. | ප්‍රදේශීය ඉංජිනේරු (ගො)/(වාරිමාර්ග)/ නාගරික ඉංජිනේරු | ප්‍රා.ඉ. (ගො) / (වාරිමාර්ග) / (පළාත් පාලන) / නාගරික ඉංජිනේරු / වෙනත් දෙපාර්තමේන්තු වල ඉංජිනේරුවරුන් සේවයේ යෙදී ඇති අවස්ථාවලදී එම ඉංජිනේරුවරුන් | | |
| 7. | ලක්ෂ 10ට වැඩි - ලක්ෂ 20ට අඩු | ශ්‍රී.ලං.තා.සේ. පුහුණු/ III/II/I | II/I ශ්‍රේණිය/ පන්තියේ තාක්ෂණ නිලධාරීන් | නාගරික ඉංජිනේරු / දි.ඉ./පළාත් පාලන ආයතන ප්‍රධානී/ දෙපාර්තමේන්තු ප්‍රධානී/ අමාත්‍යාංශ ලේකම් | | | |
| 8. | ලක්ෂ 10ට අඩු | ශ්‍රී.ලං.තා.සේ. පුහුණු/ III/II/I | II/I ශ්‍රේණිය/ පන්තියේ තාක්ෂණ නිලධාරීන් ** II/I ශ්‍රේණි වල තාක්ෂණ නිලධාරීන් නොමැති පළාත් පාලන ආයතන වල පුහුණු ශ්‍රේණිය සහ III ශ්‍රේණියේ තාක්ෂණ නිලධාරීන්ට හැකිය. ***එක් තාක්ෂණ නිලධාරියෙකු පමණක් සිටින පළාත් පාලන ආයතනවල එම නිලධාරියා විසින් සකසන ඇස්තමේන්තු පළාත් පාලන ආයතන ප්‍රධානියාට සෘජුවම අනුමත කළ හැකිය. | දි.ඉ./ නාගරික ඉංජිනේරු/ පළාත් පාලන ආයතන ප්‍රධානී/ දෙපාර්තමේන්තු ප්‍රධානී/ අමාත්‍යාංශ ලේකම් | | | |

*ප්‍ර.ඉ. - ප්‍රධාන ඉංජිනේරු / ගො.අ. - ගොඩනැගිලි අධ්‍යක්ෂ / දි.ඉ. - දිස්ත්‍රික් ඉංජිනේරු / ප්‍රා.ඉ. - ප්‍රාදේශීය ඉංජිනේරු*
*ශ්‍රී.ලං.තා.සේ. - ශ්‍රී ලංකා තාක්ෂණ සේවය / ශ්‍රී.ලං.තා.සේ.(වි.) - ශ්‍රී ලංකා තාක්ෂණ සේවය (විශේෂ) / (ඉ.සේ.) – (ඉංජිනේරු සේවා) / (වෙ.ගො.) – (වෙනත් ගොඩනැගිලි) / (පා.ගො.) – (පාසල් ගොඩනැගිලි) / (ගො) – (ගොඩනැගිලි)*

3.3 ඇස්තමේන්තු නියමිත පරිදි අනුමත කළ පසුව එම ඇස්තමේන්තු පදනම් කර ගෙන ගිවිසුම්ගත වීම ඉදිකිරීම් කටයුතු කරගෙන යාමට හා අධීක්ෂණයට, සියලු කොන්ත්‍රාත් පරිපාලනමය කටයුතු ඉටුකරගෙන යාමට ඉංජිනේරුවන් සඳහා ඉහත මූල්‍ය සීමාවන් තවදුරටත් බාධාවක් නොවිය යුතුය.

මීට පෙර නිකුත් කරන ලද, ඇස්තමේන්තු අනුමත කිරීම් හා ගිවිසුම් වලට එළඹීමේ බලතල පිළිබඳ නිකුත් කළ ඉහත සීමාවන් ඇතුලත් වූ සියලු චක්‍රලේඛයන් මෙම චක්‍රලේඛය නිකුත් කිරීමත් සමඟ අවලංගු වේ.

මේ පිළිබඳව ඔබ අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව/ ආයතනය/ පළාත් පාලන ආයතනය යටතේ පවතින ආයතන දැනුවත් කිරීමට කටයුතු කරන ලෙසටත් වැඩිදුරටත් කාරුණිකව දැනුම් දෙමි.

ආර්.සී.ද සොයිසා,
ප්‍රධාන ලේකම්,
දකුණු පළාත.

පිටපත් -
01. නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන/මුදල්/පිරිස් හා පුහුණු) - දැ.ගැ.ස
02. නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) - දැ.ගැ.ස
03. සහකාර ප්‍රධාන ලේකම් (පාලන/ආයතන/පිරිස් හා පුහුණු) - දැ.ගැ.ස
04. අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ, දකුණු පළාත - දැ.ගැ.ස
05. ගිණුම් හා ගෙවීම් අධ්‍යක්ෂ, ප්‍රධාන ලේකම් කාර්යාලය - දැ.ගැ.ස
06. අයවැය අධ්‍යක්ෂ, ප්‍රධාන ලේකම් කාර්යාලය - දැ.ගැ.ස

" විශිෂ්ටතම රාජ්‍ය සේවයක් උදෙසා"

ආණ්ඩුකාර ලේකම් කාර්යාලය
ஆளுநர் செயலகம்
GOVERNOR'S SECRETARIAT

දකුණු පළාත, පහළ ඩික්සන් පාර, ගාල්ල
தென் மாகாணம், கீழ் டிக்சன் வீதி, காலி.
Southern Province, Lower Dickson Road, Galle.

මගේ අංකය / எனது இல / My No. G/SP/1/2/1/1/2019

ඔබේ අංකය / உமது இல / Your No:

දිනය / திகதி / Date 2019.12. 27

ලැබුණා 30 DEC 2019 ප්‍රධාන ලේකම් දකුණු පළාත. D/F

ප්‍රධාන ලේකම්,
දකුණු පළාත

**ඇස්තමේන්තු සකස් කිරීමේ සීමාවන්, අනුමත කිරීමේ සීමාවන් හා ගිවිසුම්වලට එළඹීමේ සීමාවන් සංශෝධනය කිරීම.**

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබගේ අංක CSS/7/3/7 හා 2019.12.17 දිනැති ලිපිය හා බැඳේ.

02. ඒ අනුව, දකුණු පළාත් සභාවට අයත් ආයතනවල ඇස්තමේන්තු සකස් කිරීමේ සීමාවන්, අනුමත කිරීමේ සීමාවන් හා ගිවිසුම්වලට එළඹීමේ සීමාවන් පහත සඳහන් පරිදි සංශෝධනය කිරීම සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය 2019.12.26 දින ලැබී ඇති බව කාරුණිකව දන්වා සිටිමි.

1. **මූල්‍ය වටිනාකම රු.ලක්ෂ 20 ට අඩු ඇස්තමේන්තු අනුමත කිරීමේ බලතල පැවරීම.**

**කොන්දේසි**

1.1 ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ පුහුණු/ III පන්තියේ තාක්ෂණ නිලධාරීන් සකස් කරන ඇස්තමේන්තු (දිස්ත්‍රික් කාර්යාල වල/ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල/ පළාත් පාලන ආයතන වල සිටින එම ශ්‍රේණි වලට අයත් තාක්ෂණික නිලධාරීන් මෙයට අදාළ වේ.) ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ II හෝ I පන්තියේ නිලධාරියෙකු විසින් නිර්දේශ කළයුතු අතර, ඒ සඳහා වන අනුමැතිය අමාත්‍යාංශ ලේකම්/ දෙපාර්තමේන්තු ප්‍රධානියා/ මහ නගර සභාවල නගරාධිපති / නගර සභා සභාපති/ ප්‍රාදේශීය සභා සභාපති/ විසින් ලබා දිය යුතුය.

ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ II හා I පන්තියේ නිලධාරීන් නොමැති පළාත් පාලන ආයතනවල රු.ලක්ෂ 10ට වැඩි ලක්ෂ 20ට අඩු ඇස්තමේන්තු, දිස්ත්‍රික් පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයේ තාක්ෂණික නිලධාරීන් (II/I/විශේෂ) වෙත යොමුකර අවශ්‍ය නිර්දේශ ලබා ගත යුතු වේ.

ආණ්ඩුකාර ලේකම්/ Governor's Secretary -Tp/Fax 091 2222498
සහකාර ලේකම්/ Assistant Secretary -Tp 091 2226990
නීති නිලධාරී/ Legal Officer -Tp 091 3097160
පරිපාලන නිලධාරී/Administrative Officer -Tp/Fax 091 2234480
විද්‍යුත් තැපෑල/ E-mail - governsecspc@sltnet.lk
වෙබ් අඩවිය/ Web site - governer.sp.gov.lk

1.2 රු.ලක්ෂ 20 ට අඩු ඇස්තමේන්තු සඳහා වුව ද ඒවායේ විශේෂිත උපදෙස් ලබාගත යුතු ඉංජිනේරුමය විෂයන්, ව්‍යුහාත්මක සැලසුම් (Structural Drawing) ඇතුලත්ව ඇති විට තාක්ෂණ නිලධාරීන් විසින් අදාල ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී ඊට අදාල ක්ෂේත්‍රයේ (ගොඩනැගිලි,වාරිමාර්ග,මහාමාර්ග සඳහා අදාල වේ.) ප්‍රවීණත්වය ඇති ඉංජිනේරුවරුන්ගේ උපදෙස් ලබාගෙන අදාළ කටයුතු ඉටු කළ යුතුවේ.

**2. <u>ඒකක මිල ගණන් යොදා ගැනීම, මිල විශ්ලේෂණ අනුමැතිය හා රැඳවුම් මුදල් නිදහස් කිරීම.</u>**

2.1 අදාළ වර්ෂයේ අනුමත මිල ගණන් අනුසාරයෙන් ඇස්තමේන්තු සකස් කළ යුතුය.

2.2 වාර්ෂික මිල ගණන් සකස් කිරීම සෑම වසරකට දෙවරක් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් ඉංජිනේරු සේවා කාර්යාලය, පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව, පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය නියෝජනය වන පළාත් මිල කමිටුව මඟින් සිදුකරන අතර, එසේ අනුමත වූ මිල ගණන් සෑම ආයතනයක්ම තම ඉදිකිරීම් කටයුතු සඳහා යොදාගත යුතුය.

2.3. බාහිර වැඩ (Extra Work) සඳහා යොදා ගැනෙන මිල විශ්ලේෂණ, විශේෂිත මිල ගණන් ව්‍යාපෘතිය භාර ඉංජිනේරුවරයාට යොමු කර විධිමත් අනුමැතියක් ලබා ගත යුතුය. ඉංජිනේරුවරයෙකුගේ අනුමැතිය නොලත් ඇස්තමේන්තු (පළාත් පාලන ආයතන ප්‍රධානීන්ගේ අනුමැතිය ලත් ඇස්තමේන්තු) වලට අදාළ වැඩ සඳහා වූ මිල විශ්ලේෂණ පළාත් පාලන දිස්ත්‍රික් ඉංජිනේරුගේ අනුමැතිය ලබා ගත යුතුය.

2.4.**රැඳවුම් මුදල් නිදහස් කිරීම**

රු.ලක්ෂ 10 ත් 20 ත් අතර රැඳවුම් මුදල් නිදහස් කිරීම හා අවසන් ගෙවීම් වලදී සෑම විටම ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ II,I හා විශේෂ පන්තියේ නිලධාරියෙකුගේ නිර්දේශය මත විය යුතු වන අතර, විශේෂ ගැටළු සහිත අවස්ථාවකදී පමණක් ඉංජිනේරුවරයෙකුගේ උපදෙස් හා මඟ පෙන්වීම ලබාගත යුතුය.

**3.**

**3.1. <u>ඉංජිනේරුවන්ගේ අධීක්ෂණය යටතේ ඉටු කරනු ලබන කර්මාන්ත</u>**

ඉංජිනේරුවන් විසින් ඇස්තමේන්තු අනුමත කිරීමේ හා ගිවිසුම් වලට එළඹීමේ මූල්‍ය සීමාවන් 3.2 වගුවෙහි සඳහන් අයුරින් ක්‍රියාත්මක කිරීම සුදුසු වන අතර, එක් එක් ආයතන වල ඉංජිනේරුවන්ගේ අනුමත කිරීමේ මූල්‍ය සීමාවන් ඉක්මවා යන විට ඉහල වටිනාකමින් යුතු ඇස්තමේන්තු අනුමැතිය ලබා ගැනීම නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) වෙත යොමු කළ යුතුය.

## 3.2 ඉංජිනේරුවන්ගේ ඇස්තමේන්තු අනුමත කිරීමේ හා ගිවිසුම් වලට එළඹීමේ බලතල.

| අනු අංක | ඇස්තමේන්තු මුල්‍ය සීමාව (රු) | ඇස්තමේන්තු සකස් කිරීම | නිර්දේශ කිරීම | අනුමත කිරීම | ගිවිසුම්ගත වීම මුල්‍ය සීමාව අනුව | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා)/ පළාත් වාරිමාර්ග අයත් කර්මාන්ත | | පළාත් පාලන දෙපාර්තමේන්තුවට අයත් කර්මාන්ත |
| 1. | ලක්ෂ 500 ට වැඩි | II ශ්‍රේණිය/ I ශ්‍රේණිය/ විශේෂ පන්තියේ තාක්ෂණ නිලධාරීන් | විශේෂ පන්තියේ තාක්ෂණ නිලධාරීන්/ දි.ඉ/ ප්‍ර.ඉ/ ගො.අධ්‍යක්ෂ | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉ.සේ) | ප්‍රධාන ලේකම් | | පළාත් පාලන ආයතන සඳහා අදාල වන නගර සභා ආඥා පනත පළාත් පාලන ආඥා පනත, මහ නගර සභා ආඥා පනත සහ අනෙකුත් ප්‍රඥප්ති අණපනත් මගින් එම ආයතන වලට පැවරී ඇති බලතල ප්‍රකාරව ගිවිසුම් වලට එළඹීමේ බලතල එම ආයතන සතු වන අතර එම බලතල අනුව කටයුතු කල හැක. |
| 2. | ලක්ෂ 300ට වැඩි - ලක්ෂ 500ට අඩු | II ශ්‍රේණිය/ I ශ්‍රේණිය/ විශේෂ පන්තියේ තාක්ෂණ නිලධාරීන් | විශේෂ පන්තියේ තාක්ෂණ නිලධාරීන්/ දි.ඉ/ ප්‍ර.ඉ/ ගො.අධ්‍යක්ෂ | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉ.සේ) | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉ.සේ) | අදාල අමාත්‍යාංශ ලේකම් / දෙපාර්තමේන්තු ප්‍රධානී | |
| 3. | ලක්ෂ 200ට වැඩි - ලක්ෂ 300ට අඩු | II ශ්‍රේණිය/ I ශ්‍රේණිය/ විශේෂ පන්තියේ තාක්ෂණ නිලධාරීන් | විශේෂ පන්තියේ තාක්ෂණ නිලධාරීන්/ දි.ඉ/ ප්‍ර.ඉ/ | ගොඩනැගිලි අධ්‍යක්ෂ / වාරිමාර්ග අධ්‍යක්ෂ | ගොඩනැගිලි අධ්‍යක්ෂ/ වාරිමාර්ග අධ්‍යක්ෂක | | |
| 4. | ලක්ෂ 100ට වැඩි - ලක්ෂ 200ට අඩු | II ශ්‍රේණිය/ I ශ්‍රේණිය/ තාක්ෂණ නිලධාරීන් | විශේෂ පන්තියේ තාක්ෂණ නිලධාරීන් / දි.ඉ. | ප්‍ර.ඉ. (වෙ.ගො) / (පා.ගො.) / (වාරිමාර්ග) / **(පළාත් පාලන)** | ප්‍ර.ඉ.(වෙ.ගො) / (පා.ගො.) / (වාරිමාර්ග) /(පළාත් පාලන) | | |
| 5. | ලක්ෂ 50ට වැඩි - ලක්ෂ 100ට අඩු | ශ්‍රී.ලං.තා.සේ. පුහුණු/ III/II/I | I ශ්‍රේණිය/ විශේෂ පන්තියේ තාක්ෂණ නිලධාරීන්/ ප්‍රදේශීය ඉංජිනේරු | දි.ඉ. (ගො) / (වාරිමාර්ග) / **(පළාත් පාලන)**/ සිවිල් ඉංජිනේරු (ද.ප සෞඛ්‍ය දෙපාර්තමේන්තුව) | දි.ඉ. (ගො)/ (වාරිමාර්ග) /(පළාත් පාලන) | | |
| 6. | ලක්ෂ 20ට වැඩි - ලක්ෂ 50ට අඩු | ශ්‍රී.ලං.තා.සේ. පුහුණු/ III/II/I | I ශ්‍රේණිය/ විශේෂ පන්තිය/ ශ්‍රී.ලං.තා.සේ. | ප්‍රදේශීය ඉංජිනේරු (ගො)/(වාරිමාර්ග)/ නාගරික ඉංජිනේරු | ප්‍රා.ඉ. (ගො) / (වාරිමාර්ග) / (පළාත් පාලන) / නාගරික ඉංජිනේරු / වෙනත් දෙපාර්තමේන්තු වල ඉංජිනේරුවරුන් සේවයේ යෙදී ඇති අවස්ථාවලදී එම ඉංජිනේරුවරුන් | | |
| 7. | ලක්ෂ 10ට වැඩි - ලක්ෂ 20ට අඩු | ශ්‍රී.ලං.තා.සේ. පුහුණු/ III/II/I | II/I ශ්‍රේණිය/ පන්තියේ තාක්ෂණ නිලධාරීන් | නාගරික ඉංජිනේරු / දි.ඉ./පළාත් පාලන ආයතන ප්‍රධානී/ දෙපාර්තමේන්තු ප්‍රධානී/ අමාත්‍යාංශ ලේකම් | | | |
| 8. | ලක්ෂ 10ට අඩු | ශ්‍රී.ලං.තා.සේ. පුහුණු/ III/II/I | II/I ශ්‍රේණිය/ පන්තියේ තාක්ෂණ නිලධාරීන් ** II/I ශ්‍රේණි වල තාක්ෂණ නිලධාරීන් නොමැති පළාත් පාලන ආයතන වල පුහුණු ශ්‍රේණිය සහ III ශ්‍රේණියේ තාක්ෂණ නිලධාරීන්ට හැකිය. ***එක් තාක්ෂණ නිලධාරියෙකු පමණක් සිටින පළාත් පාලන ආයතනවල එම නිලධාරියා විසින් සකසන ඇස්තමේන්තු පළාත් පාලන ආයතන ප්‍රධානියාට සෘජුවම අනුමත කළ හැකිය. | දි.ඉ./ නාගරික ඉංජිනේරු/ පළාත් පාලන ආයතන ප්‍රධානී/ දෙපාර්තමේන්තු ප්‍රධානී/ අමාත්‍යාංශ ලේකම් | | | |

*ප්‍ර.ඉ. - ප්‍රධාන ඉංජිනේරු / ගො.අ. - ගොඩනැගිලි අධ්‍යක්ෂ / දි.ඉ. - දිස්ත්‍රික් ඉංජිනේරු / ප්‍රා.ඉ. - ප්‍රාදේශීය ඉංජිනේරු*
*ශ්‍රී.ලං.තා.සේ. - ශ්‍රී ලංකා තාක්ෂණ සේවය / ශ්‍රී.ලං.තා.සේ.(වි.) - ශ්‍රී ලංකා තාක්ෂණ සේවය (විශේෂ) / (ඉ.සේ.) – (ඉංජිනේරු*

3.3 ඇස්තමේන්තු නියමිත පරිදි අනුමත කළ පසුව එම ඇස්තමේන්තු පදනම් කර ගෙන ගිවිසුම්ගත වීම ඉදිකිරීම් කටයුතු කරගෙන යාමට හා අධීක්ෂණයට, සියලු කොන්ත්‍රාත් පරිපාලනමය කටයුතු ඉටුකරගෙන යාමට ඉංජිනේරුවන් සඳහා ඉහත මූල්‍ය සීමාවන් තවදුරටත් බාධාවක් නොවිය යුතුය.

මීට පෙර නිකුත් කරන ලද, ඇස්තමේන්තු අනුමත කිරීම් හා ගිවිසුම් වලට එළඹීමේ බලතල පිළිබඳ නිකුත් කළ ඉහත සීමාවන් ඇතුලත් වූ සියලු චක්‍රලේඛයන් මෙම චක්‍රලේඛය නිකුත් කිරීමත් සමඟ අවලංගු වේ.

ඩබ්.ඒ. ජනහිත
**ආණ්ඩුකාර සහකාර ලේකම්**
ආණ්ඩුකාර ලේකම් වෙනුවට
දකුණු පළාත.

ඩබ්ලිව්.ඒ.ජනහිත
සහකාර ආණ්ඩුකාර ලේකම්
ආණ්ඩුකාර ලේකම් කාර්යාලය
දකුණු පළාත

**අත්/කලේ ඒ.යූ. වේලාරත්න**
ආණ්ඩුකාර ලේකම්
දකුණු පළාත.

පිටපත්:

1. ලේකම්, ප්‍රධාන අමාත්‍යාංශය, දකුණු පළාත - කා.දැ.ගැ.ස.
2. පළාත් පාලන කොමසාරිස්, දකුණු පළාත - කා.දැ.ගැ.ස.